

අපූරු
යාළුවෝ
මිහින්දී රිව්සරි නියන්ගොඩ

# අපූරු යාළුවෝ


මිහින්දී රිවිසරි නියන්ගොඩ



මහාමායා බාලිකා විද්‍යාලය
6 ශ්‍රේණිය A



2026 මැයි මස 10 වන දින

ISBN 978-624-211-353-1

# පිදුම

මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය,

ගුරු මෑණිවරු හා සහෝදරියන්

වෙත මෙම පොත ගෞරවයෙන් පුදකරමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සුදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මුලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම්කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස  දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ට ජයග්‍රහණයකි.  මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාරධර්ම මෙන්ම නිර්මාණාත්මක ප්‍රවර්ධනය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදි. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පුජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩමකර වු හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මුලික අරමුණයි.  මේ සදහා නිර්මානකරණයෙන් දායක වු පාසල් දරුවන් මගපෙන්වු ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුදකරමු.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

# සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමාය බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළි දැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලීත්වය සහ බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මඟින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළි දැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රාර්ථනා කරමි.

සරත් බී.එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර,මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය , පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026-05-10

# සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළි දැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලී චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දැල,<br>
දියවඩන නිලමේ,<br>
ශ්‍රී දළදා මාලිගාව<br>
2026.05.10

# අපූරු යාළුවෝ

එකමත් එක කාලෙක හිටියා බලුහාමි කෙනෙක්. මේ බලු හාමි ගමරාල කෙනෙකුගේ ගෙදර තමා හිටියේ. මේ ගෙදර පූසෙකුත් හිටියා. ගමරාල පැල්රකින්න හැමදාම බලුහාමිව කුඹුරට එක්කගෙන ගියා.



දවසක් ගමරාල බලුහාමිත් එක්ක පැල් රකින්න ගිය වෙලාවක ගමරාලට නින්ද ගියා.ගමරාලට හොඳටම නින්ද ගියාට පස්සේ බලුහාමි කුඹුර පැත්තට ගියා. මේ වෙලාවේ එතන තිබුණු කැලෑවේ අලියෙක් ගසකට මුවාවෙලා සද්ද නැතුව හිටියා. බලුහාමි අලියාව දැකලා හැංගිලා ඉන්නේ මොකද ඇහුවා. අලියා කීවා ගමරාල ගෙදර යනතුරු සැඟව ඉන්නවා වී ගොයම් ටිකක් ආහාරයට ගන්න කියලා. ඒක අහපු බලුහාමි කීවා ගමරාල දැන් නිදි නිසා ගොයම් ටිකක් කන්න කියලා. බලු හාමි ගමරාල නිදාසිටින අතර කුඹුරට ගිහින් අලිහාමිට ගොයම් කන්න හැමදාම උදව් කලා.



දවසක් ගමරාලගේ ගෙදරට හොරු ආව. හොරු ගමරාලගෙ ගෙදර වටින බඩු අරන් ගියා. ගමහාමිනේ මේ ගැන කලබල උනා. මේ නිසා බලුහාමිව ගෙදර තියලා යන්න කියලා ගමහාමිනේ ගමරාලට ඇවිටිලි කලා. ඉතින් දැන් බලුහාමි ආරක්ෂාවට ගෙදර නැවතුනා.



අලිහාමි බලුහාමි එනකන් කැලයේ පුරුදු පරිදි සැඟවී සිටියා. අලිහාමිට දැන් බලුහාමිව දකින්න ලැබෙන්නේ නෑ. අලිහාමි ආපසු කැලයට ගියා. දවසක් අලිහාමි කැලේ තිබුණු විලකට ගිහින් නාන විට මඩේ එරුනා. මෙය දැකපු අනෙක් සතුන්ට මොකද කරන්නේ කියලා අදහසක් තිබුනේ නෑ.



බලුහාමිට කුඹුරට යන්න දවසක් අවස්ථාවක් ලැබුනා. ගමරාලට සුපුරුදු පරිදි නින්ද ගියා. බලුහාමි කුඹුරට බැස්සට අලිහාමිව දකින්න ලැබුනේ නෑ. බලුහාමිට දැන් දුක හිතිලා අලිහාමිව සොයන්න පටන් ගත්තා. බලුහාමි පාන්දරම පූස්හාමිට කතා කලා කැලේට ගොස් අලිහාමිව සොයාගන්න උදව් කරන්න කියලා. මෙයාලා කවදාවත් කැලේට ගිහින් නැති නිසා හිතට බයකුත් දැනුනා.



කොහොමින් කොහොමහරි මේ දෙන්නා කැලයට ඇවිදගෙන ගිහින් අලිහාමිව හොයන්න පටන් ගත්තා. පූස්හාමිට වතුර තිබහක් දැනුන නිසා ඈත තිබුනු විලක් දෙසට යන්න පටන් ගත්තා. විල කිට්ටුවට ගියපු පූස් හාමි මඩේ එරුනු අලිහාමිව දැක්කා. බලුහාමිට ඒ බව පැවසුවා. එතනට ගියපු බලුහාමි අලිහාමිව බේරගන්නේ කොහොමද කියලා කල්පනා කරන්න ගත්තා. පූස්හාමි පුංචි අපි කොහොමද අලිහාමිට උදව් කරන්නේ කියලා කීවා.බලුහාමි ශක්තිවන්ත කෙනෙක් හොයමින කැලයේ ඇවිදින අතර ඇත්හාමිව මුනගැසුනා.



ඇත්හාමි ශක්තිමත් වැල්පටක් කඩාගෙන විල දෙසට යන්න බලුහාමි සමඟ පිටත් වුනා. මේ යන අතර ඉබිහාමිව මුන ගැසුනු ඇත්හාමි හා බලුහාමි ඉබිහාමිවත් ගමනට එකතු කර ගත්තා. විල ලඟට ගිය ඇත්හාමි අලිහාමි ලඟට වැල්පට ගෙනයාමට ඉබිහාමිව යොදා ගත්තා. වැල්පට අලිහාමිට දුන් පසු ඇත්හාමි අලිහාමිව ගොඩට ඇදින්න පටන් ගත්තා. මහත් වෙහෙසක් දරා අලිහාමිව ගොඩට ඇදගන්නට ඇත්හාමිට හා බලුහාමිට හැකි වුනා. ගොඩට ආපු අලිහාමි සියලු දෙනාට අනේකවාරයක් ස්තූති කලා.




ඊට පස්සේ බලුහාමියි පූස්හාමියි ඉගෙදර ගියා. ටික දවසකට පස්සේ ගමරාලයි ගමහාමිනෙයි දවස් දෙකකට නෑදෑ ගෙදරක ගියා. ගෙදර ආරක්ෂා කරන එක බලුහාමිටයි පූස්හාමිටයි භාරදුන්නා. ඊලඟ දවසේ බලුහාමියි පූස්හාමියි මාරුවෙන් මාරුවට ගෙදර මුර කලා. ඒ අතරේ හොරු රංචුවක්ම ගමරාලගේ ගෙදරට ආවා. බලුහාමියි පූස්හාමියි එකතු වෙලා හොරු රංචුව පලවාහරින්න උත්සාහ කලා. ඒ අතරේ හොරු රංචුව බලුහාමිව අල්ලා ගත්තා. පූස්හාමි බේරිලා කැලෑව පැත්තට දිව්වා. අලිහාමිට පූස්හාමිව මුන ගැසුනා. පූස්හාමි සිද්දිය අලිහාමිට කීව්වා.



අලිහාමි මේක දැනගෙන කළබල වුනා. බලුහාමි අලිහාමිට කරපු උදව් මතක් වුනා. හොරුන් එක්ක තරහා ගත්ත අලිහාමි බලුහාමිව බේරගන්න කැලෑව කඩාගෙන ගමරාලගෙ ගෙදර පැත්තට දුවන්න ගත්තා. අලිහාමිව දැකපු හොරු රංචුව හොඳටම බයවුනා. බලුහාමිවත් අතෑරලා හිස හැරුනු පැත්තට දිව්වා. බලුහාමියි පූස්හාමියි අලිහාමිට අනේකවාරයක් ස්තූති කළා.



ගමරාලයි ගමහාමිනේයි නෑදෑ ගෙදර ගිහින් එනකන් තුන්දෙනාම සතුටින් එකටම හිටියා. ගමරාලයි ගමහාමිනේයි ගෙදර ආවා. ගෙදර හිටපු අලිහාමිව දැකපු ගමහාමිනේට කැගැසුනා. බලුහාමි ගමරාලට වෙච්ච දේ කියලා අලිහාමිව හඳුන්වලා දුන්නා. ගමරාලත් අලිහාමිට ස්තූති කරලා තමාගේ කුඹුරෙන් කොටසක් අලිහාමිට කෑමට වෙන්කරා. එදායින් පස්සේ හැමෝම සතුටින් හිටියා.



නිමි.



## පසුවදන

අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන්මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම් පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළයුතුබව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන්කිසිවකින් වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස් වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **"හේමමාලා උපහාර"** ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාරධර්ම නිපුණතා ප්‍රවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබළ ගැන්වීමට ඉතිහාසයේ යුගමෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන්, ආදි ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාටද, දියවඩන නිලම තුමන් ඇතුලු ශ්‍රී දළදා මාලිගාවේ කාර්ය මණ්ඩලයටද මෙම සද්කාර්ය වෙනුවෙන් ස්තුති වන්ත වෙමු.

සෙනෙවිරත්න මහලේකම්
( ව්‍යාපෘති නිර්මාතෘ)